Alcohol and Drug
Information Centre

ADIC

*No.40/18, Park Road, Colombo 5, Sri Lanka.*
*Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484*
*E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk*
*Web Site: http://www.adicsrilanka.org*

මාධ්‍ය නිවේදනය- 24/06/2020

# බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම් වලට ප්‍රදානය කළ රටට හිමි විය යුතු බදු මුදල් එකතු කරගැනීමට මෙවර පාර්ලිමේන්තුවට පත්වන අපේක්ෂකයන්ට හැකි වෙයිද ?


ගෝලීය කොරෝනා වසංගතයත් සමගම ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටි මුල්‍ය අර්බුදය අද දැවැන්ත මුල්‍ය අර්බුදයකට පත්ව ඇත. රටතුළ නිෂ්පාදනය අඩාල වීමත්, අපනයන ආදායම අඩු වීමත්, සංචාරක කර්මාන්තය හරහා සහ විදේශීය ශ්‍රමිකයන්ගෙන් ලැබු විදේශ විනිමය අඩුවීමත් මෙම තත්ත්වයට සෘජුව බලපෑම් එල්ල කර ඇත.

අප රට මෙවැනි දැවැන්ත මුල්‍ය අර්බුදයකට මුහුණ දෙමින් සිටින විට රජයේ වැරදි සිගරට් බදු ප්‍රතිපත්තිය නිසා පසුගිය වසර ගණනාව ඇතුළත ශ්‍රී ලංකා රජයට හිමිවිය යුතුව තිබූ අති දැවැන්ත බදු මුදල් ප්‍රමාණයක් රටට අහිමි විය.

සිගරට් මත නිසියාකාරව බදු අය නොකිරීම නිසා පසුගිය වසර පහ තුල ආසන්න වශයෙන් රජය අහිමි කරගත් බදු මුදල රුපියල් බිලියන 100කට ආසන්නය. දක්ෂිණ අධිවේගි මාර්ගය සෑදීම සඳහා රජය වියදම් කල මුදල රුපියල් බිලියන 100කි. ගුවන්තොටුපොළ අධිවේගි මාර්ගය සෑදීම සඳහා රජය වියදම් කල මුදල රුපියල් බිලියන 39කි. මොරගහ කන්ද ජලාශය සඳහා වියදම් කල මුදල රුපියල් බිලියන 91කි. රට තුල සිගරට් බදු අයකිරීමට නිසි ක්‍රමවේදයක් තිබුනේ නම් චීනයට හෝ වෙනත් රටවලින් ණය නොගෙනම මෙම ව්‍යාපෘති සිදු කිරීමට ශ්‍රී ලංකා රජයට හැකියාව තිබිණි. නමුත් බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම්වලට වාසිදායක ලෙස සිගරට් මිල වැඩිකිරීම සහ බදු ප්‍රමාණය තීරණය කිරීම නිසා රටට හිමිවිය යුතුව තිබූ දැවැන්ත බදු ප්‍රමාණයක් රටට අහිමිවිය. පසු ගිය වසර කිහිපය තුළ රජයන් කිහිපයක් යටතේ සිදුවු මෙම වරද අද දක්වා නිවැරදි නොවීම කනගාටුවට කරුණකි.

ශ්‍රී ලංකාවේ සිගරට් කර්මාන්තය ඒකාධිකාරියක් වන බැවින් සිගරට්වල බදු ප්‍රමාණය සහ වෙළඳපොළ මිල යන දෙකම වසර 2005 දක්වා රජය විසින් තිරණය කිරීම නිවැරදිව සිදුකර ඇත. ශ්‍රී ලංකාවේ සිගරට් නිෂ්පාදනය සහ අලෙවිකරන ඒකාධිකාරය දරන්නේ ලංකා දුම්කොළ සමාගම(CTC) නමින් පෙනි සිටින කොටස් අයිතියෙන් 84.13% ක කොටස් හිමි බ්‍රිතාන්‍ය සහ ඇමරිකානු දුම්කොළ සමාගමයි (BAT).

සිගරට් මිල සහ බදු පිළිබඳ නිවැරදි ප්‍රතිපත්තියක් නොමැති නිසා පසුගිය වසර කිහිපය තුළ රජයන් කිහිපයක් යටතේ බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගමේ ලාභය අති දැවැන්ත ලෙස ඉහළ ගොස් ඇති ආකාරය පහත ප්‍රස්තාරයෙන් දැක්වේ. මෙසේ ඔවුන්ගේ ලාභය ලෙස ඉහල යන්නේ අප රටට ලබාගත යුතුව තිබූ බදු මුදලකි.




සිගරට් බදු සහ මිල තීරණය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් නොමැති නිසා ශ්‍රීලාංකිකයන්ගේ මුදල්වලින් ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය සමාගම් ඔවුන්ව පොහොසත් කරගනිමින් සිටී. මේ හේතුවෙන් අයකරගත හැකිව තිබූ අති දැවැන්ත මුදල් ප්‍රමාණයක් විදේශීය සමාගම්වලට ප්‍රදානය කිරීමක් මෙමගින් සිදුවේ.

මෙලෙස සිදුවන්නේ, දේශපාලඥයින්ගේ වරදක් නිසාද නැතහොත් මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන් ඔවුන්ගේ වගකීම පැහැර හරින නිසාද යන්න ප්‍රශ්න කළ යුතුය. එසේම මහ බැංකුව සහ මාහා භාණ්ඩාගාරය ද මෙයට සෘජුව වගකිව යුතුය.

මහජනයා විසින් පත්කරගත් රජයක් කළ යුතුව ඇත්තේ, රටට වාසිදායක ලෙස ආර්ථික ප්‍රතිපත්ති සකස්කිරීම හා විදේශීය සමාගම් හා ව්‍යාපාරික ලෝකයට අවශ්‍ය ආකාරයට රටේ සම්පත් පිටරටවලට ඇදගැනීම වැළැක්වීමය.

සිගරට් බදු සම්බන්ධ මෙම ක්‍රියාවලියේදී මහජන මුදල්වලින් යැපෙන මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහ දේශපාලඥයින්ගේ මූලික වගකීම් පැහැර හැරීමක් සිදුවී ඇති බව පැහැදිලිය.

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරන අපේක්ෂකයින් හා දේශපාලන පක්ෂ මේ තත්වය වෙනස් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මොනවාදැයි මහජනතාවට පැහැදිලි කළ යුතුය. එසේ කිරීම අතිශයින් වැදගත්වන්නේ, මෙම කරුණු මත තීරණගන්නා සැලකිය යුතු ඡන්ද දායකයින් ප්‍රමාණයක් විමසිල්ලෙන් බලා සිටින බැවිනි.

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය